# DAC ඇගයීමේ නිර්ණායක

## කාර්යක්ෂමතාව

පාර්ලිමේන්තු මන්ත්‍රීවරුනි, ඔබගේ ඡන්දදායකයින්ට වඩාත් සමීප හා කාර්යක්ෂම නියෝජිතයන් වීමට ඔබ කැමැත්තක් දක්වන්නේද?

ඔබේ ඡන්දදායකයන් නියෝජනය කරමින් පාර්ලිමේන්තු විවාදවලදී නිසි ප්‍රශ්න මතු කරමින් රටේ සංවර්ධනය උපරිම කිරීමට හා එහි ප්‍රතිඵල ඔවුන්ට ලබාදීමට ඔබ උනන්දුවක් දක්වන්නේද?

එසේ නම් ඇගයීම පිළිබඳ **OECD DAC** නිර්ණායක ඔබට ප්‍රයෝජනවත් වියහැක. ඒ සඳහා මෙම කෙටි පත්‍රිකා මාලාව කියවන්න.

**ඇගයීම් පිළිබඳ ආසියා පැසිෆික් කලාපයේ පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ගේ සංසදය**

## හැඳින්වීම

ප්‍රජාතන්ත්‍රවාදයේ මූලිකහරය වන්නේ පාර්ලිමේන්තුව තුලින් වගවීම, විනිවිදභාවය හා අයිතිවාසිකම් ආරක්ෂා කිරීමට කටයුතු කිරීමයි. නීති සම්පාදනයේ ප්‍රමුඛයින් වන පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් රටේ සංවර්ධනයේ ප්‍රධාන කොටස්කරුවන්ය. පාර්ලිමේන්තු විවාදවලදී සංවර්ධන වැඩසටහන් පිළිබඳව හරවත් ප්‍රශ්න ඇසීම මගින් ඇගයීම් වලින් ලබාගන්නා තොරතුරු භාවිතා කිරීමෙන්, තිරසාර සංවර්ධනය සඳහා ජාතික ක්‍රියාවලියෙන් සම්පත් වෙන්කිරීමේදී පාර්ළිමේන්තු මන්ත්‍රීවරුන්ට මෙම ක්‍රියාවලියට දායකවිය හැකිය.

සංවර්ධනය සඳහා වන මැදිහත්වීම් පිළිබඳ මනා අවබෝධය සමග ඒකාබද්ධ වූ OECD/DAC ඇගයීම් නිර්ණායක පුරවැසියන් සඳහා උපරිම ප්‍රතිලාභ සහතික කිරීම සඳහා පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ට පාර්ලිමේන්තු විවාද සහ ආයෝජන කමිටු රැස්වීම්වලදී හරවත් ප්‍රශ්න ඇසීමට සහාය විය හැකිය.

මෙම පත්‍රිකා මාලාව තුලින් OECD/DAC නිර්ණායක හය පිළිබඳව විස්තර කරනු ලබයි.

## කාර්යක්ෂමතාව

OECD/DAC කාර්යක්ෂමතාව අර්ථ දක්වන්නේ සම්පත් හොඳින් භාවිත කරන ප්‍රමාණයයි.

එනම්, ආර්ථික හා කාලීන ආකාරයකින් ප්‍රතිඵල ලබමින් සංවර්ධන වැඩසටහන් ලබා දෙන ප්‍රමාණය, හෝ ලබා දීමට ඉඩ ඇති ප්‍රමාණයයි.

## මූලික අර්ථ දැක්වීම්

**පිරිමැසුම්දායීබව** යනු අන්තර්ගතය තුළ ප්‍රායෝගික විකල්පයන්ට සාපේක්ෂව හැකි උපරිම පිරිවැය-ඵලදායී ආකාරයෙන් යෙදවුම් (අරමුදල්, විශේෂඥතාව, ස්වභාවික සම්පත්, කාලය ආදිය) නිමැවුම්, ප්‍රතිඵල සහ බලපෑම් බවට පරිවර්තනය කිරීමයි.

**නියමිත කාලයේදී සම්පූර්ණකිරීම** යනු ක්‍රියාකාරකම් සැලසුම්වලට අනුකූලවන ලෙස අදාල කාලය තුලදී නිමකිරීම හෝ වෙනස්වන තත්ත්වයන්ට අනුව ක්‍රියාකාරකම් නිමකිරීම සඳහා කාලය ගලපාගැනීමයි. මෙහෙයුම් කාර්යක්ෂමතාව තක්සේරු කිරීම (සංවර්ධන වැඩසටහන් කෙතරම් හොඳින් කළමනාකරණය කර ඇතිද යන වග) මෙයට ඇතුළත් විය හැකිය.

**ඇගයීමේ නිර්ණායක**

**උචිතබව**
සංවර්ධන වැඩසටහන
නිවැරදි දේ සිදු කරන්නේද?

**සඵලතාව**
සංවර්ධන වැඩසටහන
එහි අරමුණු ළඟා කරගන්නේද?

**බලපෑම**
සංවර්ධන වැඩසටහන
කිනම් වෙනසක් ඇති කරන්නේද?

**ඒකාබද්ධභාවය**
සංවර්ධන වැඩසටහන
කොතරම් දුරට යෝග්‍ය වන්නේද?

**කාර්යක්ෂමතාව**
සම්පත් කොතරම්
දුරට භාවිත වන්නේද?

**තිරසාරභාවය**
ප්‍රතිලාභ දීර්ඝ
කාලීනව පවතින්නේද?

## පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ට කාර්යක්ෂමතාව පිළිබඳ නිර්ණායක භාවිත කළ හැකි ආකාරය

විධායකයේ වැඩ කටයුතු අධීක්ෂණය කිරීම සහ රාජ්‍ය අරමුදල් කාර්යක්ෂමව භාවිත කිරීම සහතික කිරීම සඳහා පාර්ලිමේන්තුවට සහ පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ට ව්‍යවස්ථාපිත වගකීමක් ඇත. මෙම වගකීමේ කොටසක් ලෙස, රජයේ අමාත්‍යාංශ සහ දෙපාර්තමේන්තු මගින් ක්‍රියාත්මක කරන සංවර්ධන වැඩසටහන් සහ මැදිහත්වීම් සඳහා ජාතික අයවැයෙන් මුදල් වෙන් කිරීම පාර්ලිමේන්තුව අනුමත කරයි.

වෙන් කළ මුදල් නිසි ලෙස භාවිත කර තිබේද, සැලසුම් කළ පරිදි වැඩසටහන් ක්‍රියාත්මක කර තිබේද, සහ වැඩසටහන අපේක්ෂිත පරිදි ක්‍රියාත්මක වී තිබේද යන්න ප්‍රශ්න කිරීම වැඩසටහන් සහ ප්‍රතිපත්ති සමග පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ට හිමිවන කාර්යභාරයේ කොටසකි.

සමාන සම්පත් ප්‍රමාණයක් හෝ සාපේක්ෂව අවම සම්පත් ප්‍රමාණයක් භාවිත කරමින් වඩා හොඳ ප්‍රතිඵල ලබාගත හැකි විකල්ප සහ වඩා කාර්යක්ෂම උපාය මාර්ග තිබේද යන්නද පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ට ප්‍රශ්න කළ හැකිය.

ගෙවීගිය කාලයේදී රාජ්‍ය අරමුදල් කෙතරම් හොඳින් භාවිත කර තිබේද යන්න පරීක්ෂා කිරීමට සහ අනාගත ජාතික අයවැය අනුමත කිරීම පිළිබඳ වන විවාදයන් දැනුවත් කිරීමට අවශ්‍ය ප්‍රබල ප්‍රශ්න ක්‍රමවත්ව සකසා ගැනීමට කාර්යක්ෂමතාව පිළිබඳ නිර්ණායක පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ට සහාය වේ.

පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් තුළ නිර්ණායක පිළිබඳ පවතින අවබෝධය මගින් තම ඡන්දදායකයින්ගේ සහ පොදුවේ පුරවැසියන්ට ඉහල ප්‍රතිලාභ හිමි කර දෙන පරිදි රාජ්‍ය සම්පත් මෙහෙයවීමට ඔවුන් හොඳ පදනමක් සකස් තබයි.

## කාර්යක්ෂමතාව සහතික කිරීම සඳහා පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ට ඇසිය හැකි ප්‍රශ්න

සංවර්ධන වැඩසටහනක, ව්‍යාපෘතියක හෝ ප්‍රතිපත්තියක කාර්යක්ෂමතාව පිළිබඳව පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ට විසින් ඇසිය හැකි ප්‍රශ්න සඳහා නිදසුන් පහත දැක්වේ. කෙසේ වෙතත්, ප්‍රශ්න ඇසීමේදී නිර්මාණශීලීවීම, රටේ සන්දර්භය සැලකිල්ලට ගැනීම, මැදිහත්වීමේ හෝ ප්‍රතිපත්තියේ ස්වභාවය සහ විවාදයේ සහ ප්‍රතිපත්ති තීරණ ගැනීමේ ක්‍රියාවලියේ අවශ්‍යතා සැලකිල්ලට ගැනීම වැදගත් වේ.

අ: වැඩසටහන හෝ ප්‍රතිපත්තිය එහි ප්‍රතිඵල සාක්ෂාත් කර ගැනීම සඳහා රාජ්‍ය සම්පත් කෙතරම් ඵලදායී ලෙස භාවිත කර තිබේද? එය මුදල් සඳහා වටිනාකමක් නියෝජනය කරයිද?

ආ: විවිධ විකල්පවල පිරිවැය සහ බලපෑම් මොනවාද?

ඇ: සැලසුම් කළ පරිදි නියමිත වේලාවට ප්‍රතිඵල ලබා දුන්නේද? එසේ නොවේ නම්, කුමන යථාවත් කිරීම් සිදු කර ඇත්ද සහ ඒවාට හේතු මොනවාද?

ඈ: සංවර්ධන වැඩසටහන් වල කාර්යක්ෂමතාවට බලපා ඇති සාධක මොනවාද?

---

*Source: De Silva,S.(2021).Theory of Change For Development Success: Workbook. Colombo, Sri Lanka: Sri Lanka Evaluation Association*

## කාර්යක්ෂමතාව පිළිබඳ තවදුරටත් අධ්‍යයනය කිරීමට අවශ්‍ය මූලාශ්‍ර


OECD evaluation criteria, retrieved from
*https://tinyurl.com/2p9835a6*

OECD (2022). Understanding the six criteria: Definitions, elements for analysis and key challenges. retrieved from
*https://tinyurl.com/bddeffx8*



**ප්‍රකාශනය**

ASIA PACIFIC PARLIAMENTARIANS FORUM FOR EVALUATION

APEA Asia-Pacific Evaluation Association

Global Parliamentarians Forum for Evaluation



විමසීම්: apea.coordinator@gmail.com



**සිංහල පරිවර්තනය**

SLEvA Sri Lanka Evaluation Association



විමසීම්: sleva.sec@gmail.com